ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව
උපාධි වැඩසටහන 2023/2024
5 වන මට්ටම
අවසාන පරීක්ෂණය - 2024
**SNU5242 /ESU3142- අන්තර්කරණ අධ්‍යාපනය**
කාලය පැය තුනයි. (03)

---

දිනය - 2025.01.26 වේලාව -ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

01 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 02 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

<u>01 - වන කොටස</u>

01. 1980 දී ලෝක සෞඛ්‍ය සංවිධානයට (WHO) අනුව බාධිත බව පිළිබඳ සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න.

02. අන්තර්කරණ අධ්‍යාපනයේ මූලධර්ම හතරක් **(04)** සඳහන් කරන්න.

03. ඩවුන් ගේ සහ ලක්ෂණ සහිත සිසුන්ගේ හැඩහුරුකම් පහක් **(05)** නම් කරන්න.

04. ඔටිසම් පරාසීය අක්‍රමතාව (ASD) සහිත දරුවන් කල්තියා හඳුනාගතහැකි ලක්ෂණ පහක් **(05)** ලැයිස්තුගත කරන්න.

05. අන්තර්කරණ පන්ති කාමරයක විවිධත්වයෙන් යුත් ඉගෙනුම්ලාභීන් පිළිබඳ සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න.

06. අන්තර්කරණ අධ්‍යාපනය ශ්‍රී ලංකාවේ දුබලතා සහිත සිසුන්ගේ ඉගෙනුම් අවශ්‍යතා සඳහා ආමන්ත්‍රණය කරන ක්‍රම තුනක් **(03)** පැහැදිලි කරන්න.

07. ශ්‍රී ලංකාව තුළ අන්තර්කරණ අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීමේදී අධ්‍යාපනඥයින් මුහුණ දෙන අභියෝග පහක් **(05)** සඳහන් කරන්න.

08. අන්තර්කරණ පන්ති කාමරයක ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලිය තුළදී විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා සහිත සිසුන් (SEN) සඳහා ඔබ සපයන ඉඩසැලසීම් දෙකක් **(02)** උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 5x 8 = 40)

## 02 - වන කොටස

09. (i.) ඩවුන් ගේ සහ ලක්ෂණය හෝ මස්තිෂ්කාඝාතය සහිත දරුවන් හට ඔවුන්ට අවේනික ඉගෙනුම් රටාවක් ඔස්සේ ආමන්ත්‍රණය කිරීමට යොදා ගත හැකි සුදුසු ඉගැන්වීම් ක්‍රම සඳහන් කරන්න. (ලකුණු 6)

(ii.) සමාජ අන්තර්ක්‍රියාකාරීත්වය අනුගමනය කරන අන්තර්කරණ පන්ති කාමර පරිසරයන් ගුරුවරුන් විසින් නිර්මාණය කළ හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 6)

(iii.) සාමාන්‍ය පන්ති කාමරයකදී ඩවුන් ගේ සහ ලක්ෂණය සහ මස්තිෂ්කාඝාතය සහිත සිසුන් සඳහා අන්තර්කරණ අධ්‍යාපන උපාය මාර්ග භාවිත කිරීමේ අභියෝග සහ ප්‍රතිලාභ විශ්ලේෂණය කරන්න. (ලකුණු 8)

10. (i.) අන්තර්කරණ පන්ති කාමරයක් තුළ දෘෂ්ටි ඌනතා සහිත සිසුන් හඳුනාගැනීම සඳහා ගුරුවරුන් විසින් සිදු කරන ක්‍රියාකාරී ඇගයීම්වලදී සලකා බලන සාධක **පහක් (05)** සඳහන් කරන්න. (ලකුණු 6)

(ii.) අන්තර්කරණ පන්ති කාමරයක් තුළ දෘෂ්ටි ඌනතා සහිත සිසුන්ට උපකාර කළ හැකි ඉගැන්වීමේ උපාය මාර්ග අවම වශයෙන් **තුනක් (03)** හඳුනාගෙන විස්තර කරන්න. (ලකුණු 6)

(iii.) අන්තර්කරණ පන්ති කාමරයක් තුළ දෘෂ්ටි ඌනතා සහිත සිසුන්ට මුහුණ දීමට සිදුවිය හැකි සමාජීය අභියෝග පරීක්ෂා කර දෘෂ්ටි ඌනතා සහිත සිසුන්ගේ චිත්තවේගීය යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සඳහා උපාය මාර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 8)

11. (i.) "කථනය" සහ "භාෂාව" යන පද පැහැදිලි කරන්න. (ලකුණු 6)

(ii.) පොදු භාෂා අක්‍රමතා **තුනක් (03)** සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 6)

(iii.) අන්තර්කරණ පන්ති කාමරයක සේවයෙහි නියුතු ගුරුවරයෙකු ලෙස කථන අක්‍රමතා සහිත සිසුන් සඳහා යොදාගත හැකි පන්තිකාමර අනුවර්තනයන් **පහක් (05)** පරීක්ෂා කරන්න. (ලකුණු 8)

12. (i.) Ysseldyke සහ Alogozzine (1998) ට අනුව ඉගෙනුම් දුබලතා (LD) සහිත සිසුන්ව කණ්ඩායම් පහකට ඇතුළත් කළ හැකි බව සඳහන් වේ. ඉහත කණ්ඩායම් **පහ (05)** සඳහන් කර ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 6)

(ii.) ඉගෙනුම් දුබලතාවයෙහි (LD) මූලික ලක්ෂණ **පහක් (05)** හඳුනාගෙන ඒවා කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 6)

(iii.) අන්තර්කරණ පන්ති කාමරයක ඉගෙනුම් දුබලතා (LD) සහිත සිසුන් සඳහා ක්‍රියාත්මක කළ හැකි සාමාන්‍ය මැදිහත්වීම් (interventions) **පහක් (05)** පරීක්ෂා කරන්න. ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න. (ලකුණු 8)



76

13. "බොහෝ රටවල සුහග සහ සහජ දක්ෂ දරුවන් හඳුනාගනු ලබන්නේ ක්‍රම කිහිපයක් භාවිත කිරීම තුළින් වේ."

(i.) සුහග සහ සහජ දක්ෂතා සහිත සිසුන් හඳුනා ගත හැකි මූලික ක්‍රම **පහක් (05)** සඳහන් කරන්න. (ලකුණු 6)

(ii.) දෙමාපියන්ට සහ ගුරුවරුන්ට මෙම සිසුන් පොදුවේ හඳුනාගත හැකිවන්නේ පොදු ලක්ෂන වලිනි. එවැනි පොදු ලක්ෂන **තුනක් (03)** පැහැදිලි කරන්න. (ලකුණු 6)

(iii.) සුහග සහ සහජ දක්ෂතා සහිත සිසුන්ගේ ශාස්ත්‍රීය හා සමාජ සංවර්ධනය කෙරෙහි ඇතිවන අභියෝගවල බලපෑම විශ්ලේෂණය කරන්න. (ලකුණු 8)

14. (i.) 2022.09.08 දිනැති අංක 33/2022 විශේෂ අධ්‍යාපන තක්සේරුකරණය පිළිබඳ චක්‍රලේඛය සහ උපදෙස් සංග්‍රහයෙහි ප්‍රධාන ලක්ෂණ **තුනක් (03)** පැහැදිලි කරන්න. (ලකුණු 6)

(ii.) අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද විශේෂ අධ්‍යාපන තක්සේරුකරණය පිළිබඳ උපදෙස් සංග්‍රහය අනුව විශේෂ අධ්‍යාපනය සඳහා වන කලාප තක්සේරුකරණය කමිටුවේ සාමාජිකයන් නම්කර විශේෂ අධ්‍යාපන තක්සේරුකරණයකදී අනුගමනය කළ යුතු කරුණු දෙකක් සාකච්ඡා කරන්න. (ලකුණු 6)

(iii.) ශ්‍රී ලංකාව තුළ සාර්ථක අන්තර්කරණ අධ්‍යාපන භාවිතයන් සහතික කිරීමට ගුරුවරුන් සඳහා නිර්දේශ කළ හැකි පුහුණු සහ වෘත්තීය සංවර්ධන අවස්ථා යෝජනා කර එම යෝජනා සාධාරණීකරණය කරන්න. (ලකුණු 8)

-සියලුම හිමිකම් ඇවිරිණි.-



77